(*g*) ඒ භූමිභාගයේ පිළි පදමිකර තුනන කාර්යයෙන් පිටත පාන් සෑදීමේ කටයුතුවල යෙදී සිටින අයම්ලුන්ට පහසු මෙන් පැමිණීස හැකි යම්කිසි ස්ථානයක අවශ්‍යතෙන් පමණක් දෙකක්මත් තැබීමට සලස්වන්නවද;

(*h*) පාන් සෑදීමේ කටයුතුවල යෙදී සිටින අයම්ලුන්ගේ ප්‍රයෝජනය සඳහා ඒ ස්ථානයේ පිරිසිදු මිතුර, පිරිසිදු තුවාය, නිසලපොතු ශුද්ධකිරීම් බිරුසු හා සබන් යන මෙහෙ තැබීමට සලස්වන්නවද;

(*i*) බෙහෙත් සම්බන්ධයෙන්වූ මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් බෙහෙත්වේ සියලුදෙනාවම පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සලස්වන්නවද;

මිනෑය.

5. බෙහෙත්යන මිලපත්‍රකාරයා විසින්—

(*a*) බෙහෙත්ස නිදහැකිමේ ස්ථානයක් වශයෙන් හෝ කිසියම් සතකු හෝ බෙහෙත්වේ කටයුතුවලට වුම්මිනාකරන බඩුවලින් තොරවූ වෙන කිසිම බඩුමක් තබාගැනීමේ ස්ථානයක් වශයෙන් හෝ පාවිච්චිකිරීමට ඉඩහැරීම;

(*b*) කිසිපරිදි හාදකලද්දවූද, මැස්සන්ට ඇතුල්වීය හොහැකි වූද, පිරිසිදුවූද, විදුරු පෙට්ටිවල තබාමිය යම්කිසි පාන්, බිස්කෝතු හෝ රසකැවිලි මිහි වෙළඳමට තැබීමට ඉඩහැරීම;

(*c*) පාන්, බිස්කෝතු හෝ රසකැවිලි වගී සෑදීමේ කටයුතු වල යෙදීසිටින කිසිවකුට ඒ සඳහා අපථ්‍යවූ හා අයහපත්වූ මිට, මිනුර හෝ වෙන යම් ද්‍රව්‍යයක් තැබීමේ කිරීමට ඉඩහැරීම;

(*d*) බිම ශුද්ධකිරීම මිණිස පහසුවෙන් එහා මෙහා ගෙනයා හොහැකිවූ කිසියම් ලී බඩුවක් හෝ උපකරණයක් බෙහෙත්ස ඇතුළත තබාගැනීම හෝ පාවිච්චිකිරීම; හෝ

(*e*) බෙහෙත්යට අයිතිවූ භූමිභාගයෙහි කිසිවෙකුම කිසියම් සුදුමක් කිරීමට හෝ නොකිස්මුණු ලෙස තැබීමට ඉඩදීම හෝ;

හොකළ යුතුයි.

6. පාන්, බිස්කෝතු හෝ රසකැවිලි වගී සෑදීමේ හෝ පිළිවේමේ කටයුතුවල යෙදීසිටින සෑම අයකු විසින්ම ඒ කටයුතුවල යෙදීමට පෙර තමන්ගේ අත් සෝදාගෙන පසුව, කිසිලි හා ශරීරයන් වැසෙන පරිද්දෙන් පිරිසිදුවූ සුදු වැස්සක් ඇඳ (හිසසහි) තොප්පියක් හෝ තලප්පාවක්ද පැළඳිය යුතුයි.

7. කිසිවෙකු විසින් බෙහෙත්යටඇතිති භූමිභාගය ඇතුළත කෙළහැකිම සඳහා සපයා තිබෙන පඩික්කමක් ඇතුළට මිස වෙනතැනක කෙළ නොහැසිය යුතුයි.

8. බෝවෙන රෝගයකින් හෝ සමේ රෝගයකින් හෝ විසංගත රෝගයකින් පෙළෙන හෝ ලඟදී පෙරන හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුව ළඟදී සාත්තුකිරීමෙහි යෙදී සිටි කිසිවෙකුට එකී රෝගය බෝවීමට හා සෝගය බිජයන් මෝරනු ලැබීමට තකවන කාලය සපුවන තෙක් බෙහෙත්යට ඇතුල්වීමට හෝ පාන්, බිස්කෝතු හෝ රසකැවිලිවලට සම්බන්ධවීමට හෝ බෙහෙත්ය භාරව සිටින අයවිසින් ඉඩහොදිය යුතුයි.

9. (1) සුදුසු සෑම විටකදී පිළි ඇතිම හෝ පාන් පිළිවීම කරනුලබන මිනෑම වෙලාවකදී ප්‍රධානතුමිගේ හෝ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමිගේ හෝ සෞඛ්‍ය පරීක්ෂකතුමාට හෝ ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් බලය පවරනලද මිනෑම නිලධාරියකුට හෝ බෙහෙත්යට ඇතුල්වී පරීක්ෂාකිරීමට නිති ප්‍රකාර බලය තිබේ.

(2) බෙහෙත්යේ මිලපත්‍රකාරයා විසින් හෝ එහි භාරව සිටින අයවිසින් ප්‍රධානතුමාට හෝ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාට හෝ සෞඛ්‍ය පරීක්ෂකතුමාට හෝ ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් බලය පවරනලද යම් නිලධාරියකුට හෝ බෙහෙත්යේ ඇතුල්වී පරීක්ෂාකිරීමට ඉඩදී ඒ ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට ඒ සඳහා මිනෑකරන කැමැති උපකාරයක්ම දිය යුතුයි.

10. බෙහෙත් පිළිබඳවූ මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම නිසා දෙවරක් හෝ ඊට වැඩි වාරෙ ගණනක් ගම්සිද උසාවියකදී වීරදකාරයා කරනු ලැබූ බලපත්‍ර කාරයකුට ඒ උසාවිය මගින් නියමකරන වෙනත් මිනෑම දඬුවම්කට අමතර වශයෙන් බලපත්‍රය අවලංගුකිරීමටද නිතිප්‍රකාර බලය තිබේ; නමුදු එසේ බලපත්‍රය අවලංගුකිරීම හැන බලපත්‍රකාරයාට කිසිම අලාභයක් අයකරගැනීමට අයිතිවාසිකමක් නැත,

11. (1) ඒ සඳහා සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ රෙකමන පිට ප්‍රධානතුමා විසින් නිකුත්කරනලද බලපත්‍රයක් පිට මිස තැත්තම් කිසිවකු විසින් කිසියම් බත්කඩයක්, රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පිහිටුවීම හෝ වෙළඳම පිණිස පවත්වාගෙනයාම හෝ නොකළ යුතුයි.

(2) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත්කරනු ලැබිය යුතු බලපත්‍රපත්‍රයක්ම 19වැනි අතුරු ව්‍යවස්ථාව යටපෝ ඉවලංගු නොකරන ලද්දේ නම් එය නිකුත්කරනලද අවුරුද්දේ දෙසැම්බර් මස නිස්සක් වැනිදාව අවසාන වන්නේය.

12. බත් කඩයක්, රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පැවැත්වීමට බලාපොරොත්තුවන කෙනෙකුගිලි පහත සඳහන් නියමයන්ට අනුකූලව නොමැති නම් 11 වැනි අතුරු ව්‍යවස්ථාවයටතේ ඒ සඳහා බලපත්‍රයක් ලැබීමට කිසිවකුට අයිතිවාසිකමක් නැත. එනම්—

(*a*) ඒ නොබනැගිලි හොඳම මිනාශ්‍රය ඇතිවන ලෙසත්, හොඳට එළිය මැවෙන ලෙසත් පිහිටා තිබිය යුතුයි;

(*b*) බිත්ති කුණු බඳුමින් කපලාරු නොට ඒවායේ සුදු කුණු හා තිබිය යුතුයි;

(*c*) බිම සිමෙන්ති දමා තිබිය යුතුයි;

(*d*) මිහලින් කුණු හා දූවිලි වැටීම මිළක්වාලීමට සුදුසු ද්‍රව්‍ය මිලින් හාදකලද සිවිලිමක් සපයා තිබිය යුතුයි;

13. බත් කඩයක, රෙස්ටෝරන්ට් ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින්—

(*a*) ඒව අයිති භූමිභාගය ගුඩ පවිත්‍ර ලෙසත්, සම්පූර්ණය සන්තිකයක් තබාගැනීමට සලස්වන්නවද;

(*b*) බත් කඩේ රෙස්ටෝරන්ට් ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ පාවිච්චිකරන හෝ ඒට අයිති සියලුම උපකරණ ලී බඩු හෝ වෙනත් බඩු බාහිරාදිය පිරිසිදුව තබා ගැනීමට සලස්වන්නවද;

(*c*) බත් කඩේ, රෙස්ටෝරන්ට් ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ ඇතුළත හෝ ඒව අයිති භූමිභාගයේ ඇති සියලුම කුණු රොඩු හා දූවිලි අතුගාවා දිනපතා දවසට දෙවරක් බැගින් ඉවත්කරවන්නවද;

(*d*) එබඳු නොබනැගිලිවල වෙළඳමට තබා තිබෙන සියලුම තේක්, රසකැවිලි හා වෙනත් ආහාර පිරිසිදුවූ හා මැස්සන්ට ඇතුල්වීය නොහැකි ලෙස කිසි පරිදි සාදන ලද්දවූ විදුරු පෙට්ටිවල තැන්පත් කරවන්නවද;

(*e*) සියලුම අහකදමන කෝ රොඩු, කෝපි රොඩු හෝ කිරි හා කැමිවලින් ඉතිරිවීන කොටස් හොඳට මේන්තුවෙන පියනක් හෝ මුඩියක් ඇත්තාවූ මැස්සන්ට ඇතුල්වීය නොහැකි භාජනයකට එකතුකරවා දිනපතා දවසකට දෙවරක් බැගින් එකී භූමිභාගයෙන් ඉවත්කර මන්නවද;

(*f*) කැමක් හෝ කිමක් සෑදීමේදී, විකිණීමේදී හා පාවිච්චි කිරීමේදී ප්‍රයෝජනයට ගනු ලබන සියලුම උපකරණ සෑම පෑ විසිතාරකට දෙවරක් බැගින්මත් සබන් හා වතුරෙන් සෝදවන්නවද;

(*g*) කිසිවකු විසින් කැමක් හෝ කිමක් පාවිච්චිකිරීමට ප්‍රයෝජනයට ගන්නාලද සෑම උපකරණයක් හෝ භාජනයක්ම එසේ ප්‍රයෝජනයට ගත් වහාම වෙනත් අයකු විසින් එය ප්‍රයෝජනයට ගැනීමට පෙර සෝදවන්නවද;

(*h*) පරීක්ෂකර බැලීමට පුළුවන්වන පරිද්දෙන් ඒ ස්ථානයේ වැඩකරන සියලුදෙනාගේම නම් හා ඔබුන්ට ලියුම් ලැබෙන පිළිවෙලවල් සඳහන් ලැයිස්තුවක් සියලු කල්හිම එකී තැබීමට සලස්වන්නවද;

මිනෑය.

14. බත් කඩයක, රෙස්ටෝරන්ට් ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින්—

(*a*) කිසියම් ඉවත දමන තේ රොඩු, කෝපි රොඩු හෝ කැමි වලින් අහක දමන වෙනත් ඉතුරු කොටස් බලපත්‍ර ලත් ස්ථානයේ බිම ඉහිරවන්නට; හෝ

(*b*) බලපත්‍ර ලත් ස්ථානයේ කිසියම් සුදුමක් හෝ නොකිස්මුණු තැබීමක් ඇතිවීමට;

ඉඩනොදිය යුතුයි.

15. බත් කඩයක, රෙස්ටෝරන්ට් ශාලාවක, හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් කල්හිම ඒකි වැඩ කරන අයට මෙන්ම ඒ ස්ථානයට පැමිණෙන අමුත්තන්වද පහසුවෙන් ප්‍රයෝජනයට ගතහැකි වන පරිද්දෙන් ඒ බලපත්‍ර ලත් ස්ථානයේ අවුගණනේ පඩික්කම් දෙකක්මත් තැබීමට සැලැස්විය යුතුයි.

16. කිසිවකු විසින් බත් කඩයක හෝ රෙස්ටෝරන්ට් ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක භූමිභාගය ඇතුළත කෙළහැකිම සඳහා සපයා තිබෙන පඩික්කමක් ඇතුළට මිස වෙන තැනක කෙළ නොතැසිය යුතුයි.

17. බෝවෙන රෝගයකින් හෝ සමේ රෝගයකින් හෝ විසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ පෙරන්නාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුව සාත්තුකිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනෙකුව එකී රෝගය බෝවීමට හා රෝග බිජයන් මෝරනු ලැබීමට වුළුමනා කාලපිළිමාවක් පසුවන තෙක් බත් කඩයක්, රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් භාරව සිටින කිසිවකු විසින් එබඳු ස්ථානයකට ඇතුල්වීමට හෝ එකී කිසියම් කැමක් හෝ කිමක් සෑදීමේ හෝ විකිණීමේ කටයුත්තකට සම්බන්ධවීමට හෝ ඉඩනොදිය යුතුයි.

18. සුදුසු හැම්පිටෙකදීම ප්‍රධානතුමාට හෝ සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමාට හෝ සෞඛ්‍ය පරීක්ෂකතුමාට හෝ ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් බලය පවරාදෙන්නේ නම් නිලධාරියකුට හෝ ඕනෑම බත් කඩයකට, රෙස්ටෝරන්ට් ශාලාවකට හෝ තේ හෝ කෝපි කඩයකට, ඇතුල්වීමට නීතිප්‍රකාශ බලය තිබේ. තවද ඕනෑම බත් කඩයක, රෙස්ටෝරන්ට් ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින අය විසින් ප්‍රධානතුමාට හෝ එබඳු නිලධාරියකුට ඒ භූමිභාගයට ඇතුල්වී පරීක්ෂාකිරීමට ඉඩදී ඒ සඳහා ඔහුට වුවමනා සෑම උපකාරයක්ම දිය යුතුයි.

19. බත්කඩ, රෙස්ටෝරන්ට් ශාලා හෝ තේ හෝ කෝපි කඩ පිළිබඳවූ මේ අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම නිසා දෙවරක් හෝ ඊට වැඩි වාරගණනක් යම්බඳ උසාවියකදී වරදකාරයා කරනු ලැබූ කිසියම් බලපත්‍රකාරයකුට ඒ උසාවිය මගින් නියමකරන වෙනත් ඕනෑම දඬුවමකට අමතර විශයෙන් ඔහුගේ බලපත්‍රය අවලංගුකිරීමටද නීතිප්‍රකාශ බලය තිබේ. එසේ බලපත්‍රය අවලංගුකිරීම හැන බලපත්‍රකාරයාට කිසිම අලාභයක් අයකරගැනීමට අයිතිවාසිකමක් නැත.

පොල්ලෙලි කොටු

20. ඒ සඳහා ප්‍රධානතුමා විසින් නිකුත්කරනු ලබන බලපත්‍රයක් පිට මිස හැන්ගම් කිසිවකු විසින් මේ ප්‍රදේශයේ ඇතුළත පිහිටි යම් ප්‍රසිද්ධ වැවක, ගංගාවක, කලපුවක හෝ මෝයකට පොල්ලෙලි හෝ දුවදඬු පෙඟවීම පිණිස කිසිම කොටුවක් සෑදීම හෝ පවත්වාගෙනයාම නොකට යුතුයි.

21. යම් කොටුපලකට, මෝයකට හෝ වැව් අඹුණු කමිටුවකට අවභිරව පවත්නා කොටුවක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් නොකළ යුතුයි.

22. සෑම බලපත්‍රයක්ම එය නිකුත්කරනු ලබන අවුරුද්දේ දෙසැම්බර් මස කිස්එක් වැනිදාට අවසාන වන්නේය.

ආහාර ද්‍රව්‍ය වෙළඳාම

23. (1) ඒ සඳහා ප්‍රධානතුමාගෙන් විධිවූ පරිදි ලබාගන්නා ලද බලපත්‍රයක් පිට මිස හැන්ගම් කිසිවකු විසින් මස්, කුකුළු, තාරා ආදී පක්ෂීන්, අලුත් මාලු, එළවලු හෝ කරක්වන සුලු වෙනත් ආහාර ද්‍රව්‍ය විකිණීම පිණිස කිසිම කඩයක්, හෝ (වෙළඳාම පොලකින් බාහිරවූ) ස්ථානයක් පවත්වාගෙන යායුතු නැත. එබඳු හැම බලපත්‍රයක්ම 28 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවලංගුකරන ලද්දේ නම් එය නිකුත්කරනලද අවුරුද්දේ දෙසැම්බර් මස කිස්එක් වැනිදාට අවසාන වන්නේය.

24. යම්කිසි කඩයක හෝ (වෙළඳාම පොලකින් බාහිරවූ) යම් ස්ථානයක මස්, කුකුළු, තාරා ආදී පක්ෂීන්, අලුත් මාලු එළවලු හෝ කරක්වන සුලු වෙනත් ආහාර ද්‍රව්‍ය අයිතිකාරයා නොහොත් වෙළඳාම්කරන්නා විසින් මස්, කුකුළු, තාරා ආදී පක්ෂීන් හා අලුත් මාලුත් එළවලුවලින් වෙන්කර නබාගෙන යුතුයි. තවද කුකුළු, තාරා ආදී පක්ෂීන්ට අනවශ්‍ය අපහසුකම් වීදින්ට සිදුනොවන සේ සෑදෙනලද කූඩුවල දමා ඒ පක්ෂීන් නබාගත යුතුයි.

25. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් විධිවූ පරිදි බලයලත් ඕනෑම කෙනකු විසින් මනුෂ්‍ය ආහාරය පිණිස මස්, කුකුළු, තාරා ආදී පක්ෂීන්, අලුත් මාලු, පලතුරු, එළවලු හා නරක්මන සුළු වෙනත් ආහාර වර්ග විකිණීම සඳහා පාවිච්චිකරන ඕනෑම කඩයක් හෝ (වෙළඳාම්පලකින් බාහිරවූ) ස්ථානයක් පරීක්ෂාකර බැලිය හැකිය.

26. (1) මේ එක්කම මිලඟට ඇති ඡේදයේ සඳහන් කොන්දේසිවලට අනුකූලවන පෙපිරියක හෝ රථයක දමා මිස හැන්ගම් කිසිම මසක් යම් මස් මඩුවක සිට යම් කඩයකට හෝ මස් විකුණන ස්ථානයකට ගෙන යායුතු නොවේ.

(2) (*a*) මස් ගෙනයාම සඳහා පාවිච්චිකරන සෑම පෙපිරියක්ම ඇතුල් පැත්තේ තුන්තැනගම් හෝ පෙරෙන ස්වභාව නොමැති ද්‍රව්‍ය මගින් අල්ලන ලදුව හා ඔඩියක් ඇතුවද තිබිය යුතුයි.

(*b*) මස් ගෙනයාම සඳහා පාවිච්චිකරන සෑම රථයකම—

(i) අව්වෙන් හෝ වැස්සෙන් හා දූවිල්ලෙන් අසිරිසිදුවීමෙන් ආරක්ෂාවීමට වසලන්න,

(ii) මහාජනයාට නොපෙනෙන සේ ආවරණයවීමට රථයේ පිටතට පවත්නා එක් එක් පැත්තේ ආවරණයක්ද,

(iii) මස් රැස්කිරීම සඳහා ඇතුල් පැත්තේ තුන්තැනගම් හෝ දියසිරාව උරාගන්නා වෙනත් යම් ද්‍රව්‍යයක් අල්ලනලද කාමරයක්ද;

තිබිය යුතුයි.

(3) (1) වැනි ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් මසක් ගෙනයනු ලබන්නේ නම් එසේ උල්ලංඝනයකිරීම ගැන වගකියයුතු වන්නේ ඒ මස් ගෙන යාමට කියම කළාවූ අයය. එසේ නැත්නම් ඒ මස් ගෙනයාම යම්කු වෙනුවෙන් කරනු ලැබෙනොත් ඒ අයය.

27. මස්, කුකුළු, තාරා ආදී පක්ෂීන්, අලුත් මාලු, එළවලු; හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය විකිණීම පිණිස යම් කඩයක් හෝ (වෙළඳාම්පලකින් බාහිරවූ) යම් ස්ථානයක් සඳහා බලපත්‍ර ලත් අය විසින්.

(*a*) ඒ වෙළඳාම්කරගෙන යන ස්ථානයේ කාවත් පෙනෙන තැනක 23 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රය සවිකොට තබාගත යුතුයි. එසේ බලපත්‍රය සවිකිරීමට නොහැකිවූ විට ලකිගත් බලපත්‍රයේ අඩකයත්, බලපත්‍රකාරයාගේ නමත්, පදිංචිලිපිනය පිත්තාරුකරනලද ලෑල්ලක්, ඒ ස්ථානයේ කාවත් පෙනෙන තැනක සවිකළහැකි යුතුයි.

(*b*) ඒ ස්ථානය ශුද්ධපවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයක තබාගෙන සයලුම මිගුල් සිමෙන්තිවලින් හා මිදුරු කැබලිවලින් පිරමිය යුතුයි.

28. ආහාර ද්‍රව්‍ය විකිණීම සම්බන්ධයෙන්වූ මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම නිසා දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා බැව් ඔප්පුවූ යම් බලපත්‍රකාරයකුට යම්බඳ උසාවියකින් නියමකරන වෙනත් දඬුවමකට අමතර විශයෙන් ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීමද, නීත්‍යනුකූලය; එසේ අවලංගුකිරීම හැන ඒ බලපත්‍රකාරයාට කිසිම අලාභයක් අයකරගැනීමට අයිතිවාසිකමක් නැත්තේය.

මහාජන සෞඛ්‍යය හා නගරාලංකාර හා නොහික්මුණු ලෙස හැසිරීම

29. සෑම ගෙයකම නොහොත් ඉඩමකම අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් තම දේපල ශුද්ධ පවිත්‍ර ලෙසත් එකී ගෙයි සිට සාර කිහයක් දුරට හෝ තම ඉඩමේ මායිම් ඒව අඩුනම් ඒ මායිම දක්වා සියලුම වල් පැලෑටි, ඉහා බහුල ලෙස වැවෙන්නාවූ හෝ සකීසයම බාධකවූ ගස් කොළන් ආදියෙන් හා සියලුම කැලි කසළ හෝ කුණු රොඩු හෝ මිදුරුමින්ගේ බෝවීම ඇතිවිය හැක් හාජන යන මේවායින් කොරවත් තබාගත යුතුයි.

30. (1) යම්කිසි ගෙයක් හෝ ගසක අත්තක් හෝ ගෙඩියක් හෝ ගසක වෙනයම් කොටසක් යම්කිසි නොබැහැගිල්ලකට අලාභහානියක් සිදුවෙන හැටියට හෝ සිදුවිය්හ පුළුවන්මන හැටියට පවත්නාවූවිට නොහොත් යම්කිසි නොබැහැගිල්ලක පදිංචිවී සිටින අයට හෝ යම්කිසි දේපලකට හෝ යම්කිසි පොදු මාවතක ගමනාගමනය කරන අයගේ ආරක්ෂාවට හෝ අනතුරු එළවිය හැකි තත්ත්වයක පවත්නාවූවිට, ප්‍රධානතුමා විසින් ඒ ගස පිහිටි ඉඩමේ පදිංචිකාරයා වෙත නොහොත් අයිතිකාරයාවෙත භාරකරනු ලබන ලියවිල්ලකින්වූ දැන්වීමකින්, ඒ දැන්වීමේ සඳහන්කරනු ලබන කාලසීමාවක් ඇතුළතදී ඒ ගස හෝ ඒ අත්ත හෝ ගෙඩිය හෝ ගසේ වෙනයම් කොටස බැඳ ශක්තිමත් කරන්නට හෝ කපා ඉවත්කර දමන්නට ඕනෑය කියා එකී අයිතිකාරයාට නොහොත් පදිංචිකාරයාට නියමකළ හැකිය;

(2) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර කරනුලැබූ සෑම කෙනකු විසින්ම එකී දැන්වීමේ නියමයක් එකී සඳහන් කාලසීමාව ඇතුළතදී ඉටුකළ යුතුයි. එකී අය විසින් ඒ නියමයක් එකී කාලසීමාව තුළ ඉටුකරන්නට බැරියයි කියාසිටි විටෙකදී නොහොත් ඉටුකිරීම පැහැරගැනීම විටෙකදී ප්‍රධානතුමා විසින් හෝ ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකු විසින් හෝ මෙහෙකරුවකු විසින් හෝ ඒ දැන්වීමේ සඳහන්කරනලද ඉඩමට ඇතුල්වී, ඒ දැන්වීමේ ප්‍රකාර එකී අය විසින් කළයුතුව තිබුන කාවර කටයුත්තක් වුවද ඉටු කළ හැකිවාත් හැර එසේ කිරීමෙන් අරක්කට සිදුවූ වියදම එකී අයගෙන් කාර්‍ය සාධාවට එන්ට තිබෙන ණයක් පරිද්දෙන් අයකරගත හැකිද මින්නේය.

31. කිසිවකු විසින් මහාජන සහනතාව දූෂණය හැකි අනුමට යම්කිසි ප්‍රසිද්ධ ස්ථානයක අයිතිකිත ලියවිල්ලක් ප්‍රසිද්ධ කිරීම හෝ යම් අසභ්‍ය පිත්තුරයක් ඇඳීම හෝ කෑත වචනවලින් ප්‍රසිද්ධකරන ලද යම් සින්දුවක් නොහොත් ගීතිකාවක් ගායනාකිරීම නොහොත් ශබ්ද නගා කීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකට යුතුයි.

32. කිසිවකු විසින් වෙනත් යම් කෙනකුගේ ගෙයකට නොහොත් මිදුලකට ගල් හෝ කුණු කසළ විසිනොකළ යුතුයි.

ශබ්දය මිංමාවත් හා අඩිපාරවල්

33. ශබ්දවූ එක් එක් මාවත හෝ අඩිපාර මේ මේ ප්‍රදේශය ඔස්සේ වැටියා යුතුයයි කියාද එහි පලල මෙතෙක් වියයුතුයයි කියාද කාර්‍ය සභාව විසින් නිරණය කරගන්නාලද ප්‍රකාරයට සෑම පොදු මාවතක් හෝ අඩිපාරක්ම හෝ හෝ හැවක හෝ පමත්වාගෙන යා යුතුයි.

34. (1) යම්කිසි ශබ්දය මාවතක් හෝ අඩිපාරක් සෑදීමේ හෝ අළුත්වැඩියා කිරීමේ වැඩක් අරම්භකර තිබෙනවිට අණ බෙරයක් නිකුත් කිරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ අවු ගණනේ තුන්දවසක් වත් කල්තියා දැනුම්දීමෙන් පසු ඒ කටයුතු සඳහා වුවමනා කරන කරම්වූ කාලයක් තුල මහාජනයා විසින් එකී මාවත හෝ අඩිපාර පාවිච්චිකරනු ලැබීම තහනම්කිරීමට ප්‍රධානතුමාට බලය තිබේ.

(2) කාර්යාලය සභාව විසින් ඒ සඳහා සම්මත කරගනු ලැබූ යෝජනාවකින් බලය පවරා තිබෙන විට, ප්‍රධානතුමා විසින් කිසියම් පොදු මාවතක හෝ අධිපාරක ඕනෑම වර්ගයක හෝ පඩිකඩයක අධික රථවාහන ගමනාගමනය සීමාකිරීම හෝ නතරකිරීම නියාමනකුල වන්නේය.

35. ඒ සඳහා ප්‍රධානතුමා විසින් නියමිත ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම පුද්ගලයකු විසින්—

(1) සාදා තිබෙන්නාවූ නොහොත් සෑදීමට අරඹා තිබෙන්නාවූ යම්කිසි සම්බද්ධ මාවතක් හෝ අධිපාරක් යටත් නොහොත් ඒ අසල පිහිටි ඕනෑම ඉඩමකට වුවමනාකරන සියලුම මෑඩකාරයන්, රථවාහන, ගතුන් හා උපකරණ ඇතුව උදේ 7වන් සවස 5වන් අතර කාලය තුල ඒ මාවත හෝ අධිපාර සම්බන්ධයෙන්වූ යම් කර්මාන්තයක් කිරීම පිණිස ඇතුල්වීමද,

(2) ඒ කර්මාන්තය කරන ස්ථානයෙන් ඉවත්කිරීමට වුවමනා පස්, කුණු කසළ හෝ ද්‍රව්‍ය සාදා තිබෙන්නාවූ නොහොත් සෑදීමට අරඹා තිබෙන්නාවූ සම්බද්ධ මාවතක් හෝ අධිපාරක් තාව හෝ ලංව පිහිටි ඕනෑම ඉඩමකට විසිකිරීමද, (එහෙත් එකී පස් කුණු කසළ, හෝ වෙනත් ද්‍රව්‍ය නිසිකාලයක් ඇතුළතදී ඉවත් කර දැමිය යුතුයි.)

(3) සාදා තිබෙන නොහොත් සෑදීමට අරඹා තිබෙන යම් සම්බද්ධ මාවතක් හෝ අධිපාරක් සම්බන්ධයෙන්වූ යම් කර්මාන්තයක් කරගෙනයන කාලයතුළදී ඒ කර්මාන්තය කරගෙන යෑම සඳහා එකී මාවත හෝ අධිපාර අසල ඇති ඉඩම් හරහා කිසියම් තාවකාලික පාරක් සෑදීමද, (එහෙත් ඒ තාවකාලික පාර යම්කිසි ගොඩනැගිල්ලක් තිබෙන ඉඩමකට හෝ කොටුකර තිබෙන ඉඩමකට හෝ මිදුලකට උඩින් ගෙනයා යුතු නැත.)

(4) යම්කිසි සම්බද්ධ මාවතක් හෝ අධිපාරක් ආරක්ෂා කිරීම පිණිස, මැඩිදියුණුකිරීම පිණිස, අළුත්වැඩියාකිරීම පිණිස හෝ සෑදීම පිණිස, යම්කිසි කාෂ්ඨ, දිය අගල් මැදවල් හෝ බෙල්ක්කු සෑදීමක්, අළුත්වැඩියාකිරීමක් හෝ ගුඩකිරීමක් අවශ්‍ය වන්නේ නම් එසේ කිරීමට ඕනෑම ඉඩමකට ඇතුල්වීමද,

නියාමනකුල වන්නේය:

36. කිසිවකු විසින්—

(a) කසා අවසන්කරනලද හෝ කසාගෙනයන්නාවූ හෝ කිසිම සම්බද්ධ මාවතකට හෝ අධිපාරකට අනතුරු කිරීම, අලාභකිරීම, අවහිරකිරීම, බලෙන් අල්ලා ගැනීම හෝ වෙනත් ක්‍රමයකින් බාධාකිරීම හෝ;

(b) කාර්යාලය සභාවේ අවසරය පිව මිස නැත්නම් එසේ කසා අවසන්කරනලද හෝ කසාගෙනයන්නාවූ හෝ කිසිම සම්බද්ධ මාවතක් හෝ අධිපාරක් වෙත අතකට හැරවීම හෝ නොකළ යුතුයි.

37. (1) කුඹුරු මැදින් වැටිතිබෙන යම්කිසි පොදු අධිපාරක් සිරස් පරිදි එකී නිසි පළල් ප්‍රමාණය ඇතිව මැනවින් පාලනය කිරීම ඒ ඒ කුඹුරු හිමියන්ගේ හා හොවින්ගේ යුතුකම වන්නේය.

(2) එසේ කිසිම අධිපාරක් ඊව සිරස් පරිදි වුවමනා කරම්වූ පළල් ප්‍රමාණය අඩුවන ලෙස කිසිවකු විසින් කැපීම හෝ බලෙන් අල්ලා අවහිරකිරීම හෝ නොකළ යුතුයි.

දූෂණය

38. (a) කිසිවකු විසින් යම් ප්‍රදේශය ඇතුළත දැදුවලින් හෝ කඩදාසිවලින් සුදුකෙළිම හෝ මුදල් බිම්ටුකිරීමෙන් යම් ක්‍රීඩාවක් කිරීම හෝ මොනම අනුමෙවක් බිම්ටු ඇල්ලීමකට සම්බන්ධවීම හෝ නොකළ යුතුයි.

(b) කිසිවකු විසින් තමා පදිංචිව සිටින, තමාට අයිතිව තිබෙන හෝ තමා භාරයේ තිබෙන ගෙයක, දේපලක, බිරුවක, පාරුවක හෝ රථවාහනයක දැදුවලින් හෝ කඩදාසිවලින් සුදුකෙළිමිව හෝ මුදල් බිම්ටුකිරීමෙන් කිසියම් ක්‍රීඩාවක් කිරීමට හෝ ඉඩදිය යුතු නැත.

කුකුළන් කොටවීම

39. කිසිවකු විසින් යම් ප්‍රදේශයතුළ කිසිම තැනක පොර කොටවීම සඳහා කුකුළන් දුහුණුකරවීම හෝ කුකුළන් පොර කොටවීමෙහි යෙදීම හෝ නොකට යුතුයි.

කරත්ත යටට කරත්ත විසිදීම

40. කිසිවකු විසින් පොදු මාවතක හෝ අධිපාරක කරත්ත යටට කරත්ත (රෙස්) දුවවීමෙහි නොයෙදිය යුතුයි.

ලී, පිලි හා ස්නාන ස්ථාන ආදිය

41. යම්කිසි පොදු ලිදක හෝ යම්කිසි ස්නාන ස්ථානයක සිරිමි, ගෑණු දෙපක්ෂයෙන් හුදෙක් එක් පක්ෂයක පමණක් ප්‍රයෝජන සඳහා කැයි කාර්යාලය සභාව විසින් කොටුකරනලද කිසිම ස්ථානයකට අයිත් පක්ෂයේ කිසිවකුන් විසි ඇතුල් නොවිය යුතුයි.

42. (1) යම්කිසි බෝවෙන රෝගයකින් හෝ වසංගත රෝගයකින් හෝ යම් රෝගයකින් පෙළෙන්නාවූ හෝ රෝගදී පෙළිනාවූ කිසිවකු විසින් ඒ රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරණ ලැබීමට තතමන කාලසීමාවන්පසුම්තෙක් කිසිම පොදු ලිදක හෝ පොදු ස්නාන ස්ථානයක් විශෙයෙන් කාර්යාලය සභාව විසින් මෙන්කරනලද කිසිම ජලස්ථානයක හැම හෝ සේදීම නොකළ යුතුයි.

(2) 1 වැනි ඡේදයේ සඳහන් කරනලද යම්කිසි අයකුගේ ප්‍රයෝජනය සඳහාවූ ජලය සෞඛ්‍යයට පත්නවූ කිසිවකු විසින් ඒ ලිදෙන් හෝ ස්නාන ස්ථානයෙන් ලබාගෙන එය ප්‍රයෝජනය ගැනීම පිණිස එසේ අකි විසිපතළවත් ඇතැව ගෙන යා යුතුයි.

43. (1) කිසිවකු විසින් පොදු ලිදක හෝ පොදු ස්නාන ස්ථානයක් විශෙයෙන් මෙන්කරනලද කිසිම තැනක කිසිවක සතෑ, රෙදිපිළි, පැදුරු හෝ මෙහෙන් කිසිම ද්‍රව්‍යයක් සේදීම හෝ සේදීමට හැලැස්වීම නොකළ යුතුයි.

(2) කිසිවකු විසින් මොනම කාරණයක් නියාවක් කිසිම පොදු ස්නාන ස්ථානයකට කිසිම සතකු දැක්වීම, එලවීම හෝ ගෙනයාම නොකළ යුතුයි.

(3) කිසිවකු විසින් කිසිම පොදු ලිදක හෝ ස්නාන ස්ථානයක මිතුර හෝ මල විසිපිටි භූමිභාගය හෝ මොන පිදියකවත් අපවිත්‍ර නොකළ යුතුයි.

44. (1) කිසිවකු විසින් කාර්යාලය සභාවේ අනුමතියකින් හැම හෝ සේදීම සඳහාමිකර තිබෙන යම් පොදු ලිදක, පිල්ලක හෝ වෙනත් යම් ජලස්ථානයක හැම හෝ සේදීම නොකළ යුතුයි.

(2) කාර්යාලය සභාව විසින් යම් වැමක, ඇලක හෝ වෙනත් ජලස්ථානයක යම්කිසි විශෙෂ ස්ථානයක් රෙදි සේදීම සඳහාය, හැතහොත් හැම සඳහාය, නැතහොත් මනුෂ්‍යයන්ගේ කිමි සඳහාය, නැතහොත් සතුන් නැවීම සඳහාය කියා වෙන්කර තිබෙනවිට කිසිවකු විසින් එබඳු ස්ථානයක් එසේ වෙන්කොට ඇති කටයුත්තකින් බැහිරවූ වෙනත් කටයුත්තක් සඳහා භාවිත නොකළ යුතුයි.

45. කිසිවකු විසින් ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් ලත් අවසරයක් නැතුව යම් පොදු ලිදක, වැවක හෝ වෙනත් යම් කිසි ජලස්ථානයක හෝ ජලය, කරත්තයකින් හෝ පිල්පයකින් හෝ කලින් කල කාර්යාලය සභාව විසින් නියම කරනු ලබන ප්‍රමාණයට වඩා හෝ ගෙන යා යුතු නැත.

අපථ්‍ය ආහාර පාන

46. කිසිවකු විසින් අපථ්‍යවූ නොහොත් මනුෂ්‍ය ආහාරයට නුසුදුසුවූ කිසිම ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් මෙළඳුමට තැබීම නොහොත් ඉදිරිපත්කිරීම නොකළ යුතුයි.

47. මෙළඳුම් පිණිස තබා තිබෙන්නාවූ නොහොත් ඉදිරිපත් කොට තිබෙන්නාවූ ඕනෑම ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් මනුෂ්‍ය ආහාරයට නුසුදුසු බව හෝ අපථ්‍ය බව පෙනෙන්නම් තිබේනම් ප්‍රධානතුමා විසින් හෝ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමා විසින් හෝ සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් යම් අයකු විසින් හෝ එසේ ආහාර ද්‍රව්‍ය හෝ බීම වර්ගය අල්ලා තහනම්කිරීම නියාමනකුලය.

48. සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමකු නොවූ වෙනත් යම් නිලධාරියකු හෝ අයකු විසින් 47 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් අල්ලා තහනම්කරනවිට මතු විසින් ඒ ද්‍රව්‍ය අල්ලා තහනම්කළේ යම් කෙනෙකු භාරේ තිබුනද්ද, මතු ඉදිරිපිටදීම ඒ අල්ලා තහනම්කරනු ලැබූ ද්‍රව්‍යයේ සැම්පලයක් භාජනයක බහා, එය මැනෙනසේ සිල්තබා අප්‍රමාදෙම ඒ සැම්පලය සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමා නොහොත් වෙනත් යම් අයකුවත් වෛද්‍ය නිලධාරීතුමකු ඉදිරියේ පෙන්නුම් කළ යුතුයි.

49. 47 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් තහනම්කරනු ලබනවිට, එකී ද්‍රව්‍යය තහනම්කරනු ලැබුවේ යම්කිසි අයකුගේ භාරයේ තිබේනද්ද ඒ අය විසින් ඒ ද්‍රව්‍යයේ සැම්පලයක් සිල්තබා තමාට ඕනෑය කියා ඉල්ලා සිටියොත් ඒ ද්‍රව්‍යය තහනම්කරන්නාවිසින් තහනම්කළ ද්‍රව්‍යයේ සැම්පලයක් භාජනයක බහා, ඒ ද්‍රව්‍යය අයිතිව සිටි අය ඉදිරිපිටදීම සිල්තබා ඒ අයට දියයුතුයි.

50. 47 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් තහනම්කළ වෛද්‍ය නිලධාරීතුමා හෝ 48 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් ඉදිරිපත්කර තිබෙන වෛද්‍ය නිලධාරීතුමා හෝ එකී ද්‍රව්‍යය අපථ්‍යය කියා නොහොත් මනුෂ්‍යාහාරයට නුසුදුසුය කියා සහතික කරතිනම්, ප්‍රධානතුමා විසින් එකී ද්‍රව්‍යය විනාශකර දැමීමට හෝ එය වෙළඳුම පිණිස තැබීම තැනහොත් මනුෂ්‍යාහාරයක් මෙන් ප්‍රයෝජනයට ගැනීම වැලැක්වෙන පරිදෙන් මහාජනයන් කිරීමට හෝ හැලැස්විය යුතුයි. ඒ ආහාරද්‍රව්‍ය නොහොත් බීම අපථ්‍ය නොවේය කියා නොහොත් මනුෂ්‍යාහාරයට නුසුදුසුය කියා වෛද්‍ය නිලධාරීතුමා සහතිකකරන්නාහ්, තහනම්කරනු ලැබූ එබඳු ආහාර ද්‍රව්‍යය නොහොත් බීම වර්ගය අයිතිකාරයාට අපසු දිය යුතුයි.

51. ස්වාභාවික හේතුන් නිසා හෝ යම්කිසි රෝගයකින් හෝ දීමේ නිලියෝමෙන් හෝ සමියකු විසින් දක්වකරනු ලැබීමෙන් හෝ පිස්සු බල්ලෙකු විසින් සපාකනු ලැබීමෙන් හෝ මිලාවූ නොමෙනෑත් විෂමිශ්‍රයකු විසින් මරණ ලැබුම්වූ සතකුගේ මස් විකිණීම හෝ වෙළඳමට තැබීම කිසිවකු විසින් නොකළ යුතුයි.

කාණු, කොයකිලි, අශුචි වළවල්, අළු වළවල් හා ගෞඛ්‍ය පනතකම සඳහාවූ උපකරණ පරීක්ෂාකර බැලීම හා ශුබපත්‍ර කිරීම

52. ප්‍රධානතුමා විසින් හෝ ගෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ ගෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් හෝ ප්‍රධානතුමා ගෙන් ලියවිල්ලකින් බලයලත් කම් කෙනෙකු විසින් හෝ යම් ප්‍රදේශයකුල යම් දේපලක පිහිටි ඕනෑම කාණුවක්, කොයකිලියක් අශුචි වළක්, අළු වළක් හෝ සනීපාරක්ෂාව සඳහා නඩත්තු කරනු ලබන යම් දෙයක් පරීක්ෂාකිරීම හා ඕනෑම සුදුසු වෙලාවකදී එසේ පරීක්ෂාකිරීම සඳහා එබඳු ස්ථානයකට ඇතුල් වීමක් නිතාන්තකුලය; නමුත් එකී ස්ථානයේ අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් හෝ ඒ සඳහා අවශ්‍ය වියහැකි සියලුම ආධාරකළ යුතුයි.

53. ප්‍රධානතුමා විසින් හෝ ප්‍රදේශය ඇතුළත ඕනෑම දේපලක අයිතිකාරයා වෙත හෝ පදිංචිකාරයා වෙත නිකුත් කරනුලබන දැන්වීමකින් විහාම හෝ ඒ දැන්වීමේ දක්වනුලබන යම් කාලසීමාවක් ඇතුළත ඒ දේපලේ පිහිටි යම් කාණුවක් කොයකිලියක් අශුචි වළක්, අළු වළක් හෝ සනීපාරක්ෂාව සඳහා නඩත්තුකරන දෙයක් සනීපාරක්ෂානුකූල තත්වයක තබා ගැනීමට වුවමනාවිය හැකිවූ ඒ දැන්වීමේ සඳහන්කොට ඇති යම් යම් දේමල් කරන්ට ඕනෑය කියා නියමකරන හැකියි.

54. ප්‍රධානතුමා විසින් යම් ප්‍රදේශය තුළවූ යම් දේපලක අයිතිකාරයා වෙත හෝ පදිංචිකාරයා වෙත නිකුත්කරනු ලබන දැන්වීමකින් ඒ දැන්වීමේ දක්වනුලබන යම් කාලසීමා මක් ඇතුළත ඒ දේපලේ පිහිටි යම් කාණුවක්, කොයකිලියක්, අශුචි වළක්, අළු වළක් හෝ සනීපාරක්ෂාව සඳහා නඩත්තුකරන යම් දෙයක් ඇතුලේ තිබෙන ද්‍රව්‍ය ඉවත්කර දමන්ට ඕනෑය කියා හෝ ඒවා ඇතුලේ තිබෙන ද්‍රව්‍ය වෙනත් යම් ස්ථානයකට එකී සඳහන්කරනුලබන යම් අපහසකින් සුදුස්සක් කිරීම පිණිස ඉවත්කිරීමට සලස්වන්න ඕනෑය කියා හෝ නියමකිරීම නිතාන්තකුලය.

වැසිකිලි සෑදීම

55. (1) අසවල් ප්‍රදේශය තුළ කිසිසුත් කියයකරන ඕනෑම දේපලක අයිතිකාරයා විසින් හෝ බලධාරියා විසින් වැසිකිලියක් සාදා පවත්වාගෙන යායුතුයි කියා කියයි සහාම විසින් යම් ප්‍රදේශයක සීමා නියමකර තිබෙන කවර පිවකදී වුවත් ප්‍රධානතුමා විසින් එකී අයිතිකාරයා වෙත හෝ බලධාරියා වෙත භාර කරනුලබන ලිඛිතවිලකින්වූ දැන්වීමකින් ඒ දැන්වීමේ සඳහන් කරනුලබන විධියක හා ප්‍රමාණයක වැසිකිලියක් කායයි සහාම විසින් තීරණකොට ඇති ප්‍රකාරයටවූ නියමයන්ට එකඟවමිද, කාණු ආදිය සම්බන්ධකොටවද, ඒ දේපලේ අසවල් ස්ථානයේ සාදන්ට ඕනෑයයි අණ කළ හැකිය.

(2) 1 වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරකරනුලැබූ සෑම දේපල හිමියකු විසින් හෝ බලධාරියකු විසින් තමාට ඒ දැන්වීම භාරදුන් දින සිට දවස් තිහක් ඇතුළතදී හැම අතින්ම ඒ දැන්වීමේ දක්වා ඇති නියමයන්ට එකඟව වැසිකිලියක් සෑදිය යුතුයි.

56. ප්‍රධානතුමාගෙන් අවසර නැතුව කිසිවකු විසින් කිසිම ලිඳක සිට අඩි සියයක අරවිත්කමිනය තුළ වැසිකිලි මළක් සෑදීම හෝ නඩත්තුකිරීම නොකළ යුතුයි.

මැරුණවූ සතුන්ගේ මළකුණු ඉවත්කිරීම

57. යම්කිසි සතකු මැරුණමිව, ඌ මැරුණ වේලාවේ සිම පැ දෙළහක් ඉකුත්වී තත්පර විත්කෙන් ඒ සතාගේ මළකුණ මළලා දැමීමට සැලැස්වීම ඒ සතා අයිතිකාරයාගේ හෝ අයිතිකාරයා නොමැති කල්හි ඒ සතාගේ මරණය සිදුවූයේ යම් ඉඩමකද, ඒ ඉඩමේ පදිංචිකාරයාගේ හෝ සුතුකම විත්කෙන්ය.

58. මැරුණවූ යම් සතකුගේ මළකුණක් වළලාදැමීමට 57 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ නියමිත සුතුවූ යම්කිසි කෙනකු පැ දෙළහක කාලසීමාව ඇතුළතදී ඒ සතා වළලාදැමීම පැහැර හැරීයොත් ප්‍රධානතුමා විසින් ඒ සතා වළලාදැමීමට සැලැස්විය යුතුවාත් හැර ඒ නිසා දරන්ට සෙලකෙනවූ සියදම් එකී අයගෙන් කායයි සහාමට අයකරගන්ට තිබෙන ණයක් පරිද්දෙන් අය කරගත හැකිය.

කිරි පවිටි හා කිරි විකිණීම

59. (1) කිසිවකු විසින්—

(a) 60 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර දරන්නකු හෝ 73 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි කිරීමේ කාඩ්පත්‍රයක් නිකුත්කරනුලැබූ කිරි වෙළන්දකු; හෝ

(b) ලියාපදිංචිකරනලද කිරි සපයන්නකු හෝ 79 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ නිකුත්කරනුලැබූ හදුනා ගැනීමේ කාඩ්පත්‍රයක් දරන්නකු; හෝ

වත්තේනම් මස හැත්නම් යම් ප්‍රදේශය තුළ නිපදවනලද කිරි කිසිම විටක ඒ ප්‍රදේශය තුළ විකිණීමට තැබීම, විකිණීමට ඉදිරිපත්කිරීම හෝ ගෙන යෑමේදීම හෝ විකිණීම හෝ ඇවිද විකිණීම හෝ නොකළ යුතුයි.

(2) 82 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් නිකුත්කරනු ලැබූ ලියාපදිංචිකළ කිරි බෙදා හරින්නකු මත්තේ නම් මස හැත්නම් කිසිවකු විසින් යම් ප්‍රදේශය ඇතුළත කිසිම විටෙක ඒ ප්‍රදේශයෙන් පිවත නිපදවන ලද කිරි විකිණීමට තැබීම, විකිණීම, විකිණීමට ඉදිරිපත්කිරීම, ගෙන යෑමේදීම, ඇවිද විකිණීම හෝ වෙළඳමට ගෙනයෑම හෝ නොකළ යුතුයි.

60. ප්‍රධානතුමා විසින් නිකුත්කරනලද බලපත්‍රයක් දරන්නේනම් මස හැත්නම් කිසිවකු විසින් එලදෙනුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනකින් යුත් කිරි පවිටියක් පවත්වාගෙන යායුතු නොවේ.

61. බලපත්‍රයක් නිකුත්කිරීමට අදහස්කරනුලබන ස්ථානය පහත දැක්වෙන නියමයන්ට අනුකූලව තිබෙනොත් මස හැත්නම් එලදෙනුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනකින් යුත් කිරි පවිටියක් තබාගැනීමට කිසිවකුට බලපත්‍රයක් දෙනු නොලැබේ.

(1) ඒ ස්ථානයේ එලදෙනුන් නතරකිරීමට අදහස්කරනු ලබන සෑම කොඩිකැඩිල්ලක් හෝ මඩුවක්ම :—

(a) ගඩොල්, ගල්, කබොක් නොගෙන් ලීවලින් සාදා කිසිය යුතුයි;

(b) එකී බිත්තිවල හා කුලුණුවල සුදු තුණු හා කිසිය යුතුයි;

(c) එකී මිනල කලක් පවතින ද්‍රව්‍යයකින් සාදා කිසිය යුතුයි;

(d) එකී කිම සිමෙන්තියෙන් හෝ සිමෙන්ති කොන්ක්‍රීට්වලින් හෝ ගල්තාරවලින් යකඩකරනුලැබ ගල් හෝ ගඩොල් අල්ලා කිසිය යුතුයි;

(e) මුත්‍රා හෝදන වතුර, හා වෙනත් කුණු වතුර වගනලද භාජන ඔකකව හෝ ඊට වැඩි ගණනක් ඇතුළව ගලා යෑමට හැලැස්වීම පිණිස සිමෙන්තියෙන්, සිමෙන්ති කොන්ක්‍රීට්වලින් හෝ ගල්තාරවලින් යකඩකරනු ලැබ ගල් හෝ ගඩොල් අල්ලනලද කාණු ඇතුව කිසිය යුතුයි;

(f) කිරි පවිටියේ තබාගැනීමට අදහස්කරන එලදෙනුන්ගේ සංඛ්‍යාව හැටියට එක් එලදෙනකුට අඩුගණනේ දිගින් අඩි අටකව හා පළලින් අඩි පහක කිමි ප්‍රමාණයක් බැගින්ද ඝන අඩි හාරෙසියයක මිතාශ්‍රයද ඇතුව කිසිය යුතුයි;

(2) ඒ ස්ථානයේ කිරි කාමරය මෙන් පාවිච්චි කිරීමට අදහස් කරන කොඩිකැඩිල්ල හෝ මඩුව :—

(a) කරක් මඩුවම සිව හෝ වෙනත් කොඩිකැඩිලිවල සිව අඩි විසිපහකව අඩුනොවූ දුරකින් හා කිසියම් වැසිකිලියක වැසිකිලි වළක, අපු වළක, සඳකාලික පෝරණොඩක හෝ පොළවකට කණිකලද අනාවරණ කාණුවකට සිට අඩි සියයකට අඩුනැති දුරකින්ද සුදුසුවූ ස්ථානයක පිහිටුවා තිබිය යුතුයි;

(b) ගල්, ගඩොල් හෝ කණුක්වලින් හා කපලාරු කොට ඇතුළේ සුදු තුණු තාන්නලද උසින් අඩි හතකට නොඅඩු බිත්ති ඇතුව තිබිය යුතුයි;

(c) එළිමහනට නෙරා නිකිනෙහෙයේ අඩුගණනේ එකකට එකක් ඉදිරියෙන් පිහිටි බිත්ති දෙකක්වත් ඇතුව තිබිය යුතුයි;

(d) එකී කිම සිමෙන්ති දමනලදුවද, බිත්ති පොළවට සම්බන්ධ වන ස්ථාන සිමෙන්තියෙන් වටකුරුකරන ලදුවද තිබිය යුතුයි;

(e) ඇතුළට දුම්ලිමැටීම වළක්වාලීමට හැකි පුලුගුම්ද්‍ද, තෙල් ගායම කරනලද රෑලිවලින් සාදනලද සිලිමක් ඇතුව තිබිය යුතුයි;

(f) පොළෝ මට්ටමේ සිට අඩුගණනේ අඩි හතක්වත් උසින් පිහිටි වහල්පල ඇතුව තිබිය යුතුයි;

(g) අඩුගණනේ ජනේලයක් හා දොරක්ද, කිමි වර්ග ප්‍රමාණයෙන් පහළොහෙන් එක සංතුම්කව අඩුනොවන ජනේල වර්ග ප්‍රමාණයක්ද මැස්සන්ට ඇතුල්විය නොහැකි ලෙස අවරණය කරන්නලද ජනේල හා දොරමිල්ද අඩුගණනේ එක දොරකවවත් ප්‍රතිපිරුබම පිහිටුවනලද ජනේලයක්ද ඇතුව තිබිය යුතුයි;

(h) කිරිකරුඩ, ගල්ලෑලි, තුන්තනාගම හෝ ප්‍රධානතුමා විසින් පිළිගන්නාලද නොපෙරෙන ස්වභාවයකින් යුත් මෙනයම් ද්‍රව්‍යයකින් අවරණය කරනලද මේසයක්ද, ශුබපත්‍රව තබාගනුලබන කුණු පෙට්ටියක් හා පිරිසිදු බෝතල තැබීමට සුදුසු රාක්කයක්ද ඇතුව තිබිය යුතුයි.

62. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙන් පිටත කාවත් පෙනෙන ස්ථානයක "Licensed Dairy" යන වචනයෙන් එහි සිංහල අනුවාදයක් (බලපත්‍රලත් කිරිපවිත්‍රය) පැහැදිලි වලය අදිනලද රෑල්ලක් ගම්කර තැබිය යුතුයි.

63. ඕනෑම වෙලාවකදී පරීක්ෂාකර බැලීමට හැකිවන පරිදි හැම බලපත්‍රකාරයකු විසින්ම (කිරි විකුණන්නන්ගේ නම් හා ඇතුළුව එහි සේවයෙහි නියුක්ත සියළුම අයවලුන්ගේ වචනව ලියුම් රූපෙන පිළිවෙලින් සඳහන් රැකිත්තුවක්ද, තමා කිරි සපයන සියලුම අයවලුන්ගේ නම් හා ලියුම් රූපෙන පිළිවෙළවල් සහිත ලේඛනයක්ද කිරි පවිත්‍රය තුළ තබාගත යුතුයි.

64. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින්—

(a) අවුරුද්දකට දෙවරක් එනම් ජූනි හා දෙසැම්බර් යන මාස්වලදීත් ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් නියම කරනුලබන වෙනත් යම් කාලවෙලාවිල්වලදීත් කිරි පවිත්‍රයේ කොටසක්කොට ඇති හැම කාමරයකම බිත්තිවල සුදුසුණුගැවීමටත් එහි ලී වැඩ ගඩන් හා උණුවතුරෙන් සේදවීමටත්;

(b) අවුරුණෙන් දිනකට එකවරක් බැගින්වත් කිරි කාමරයේ බිම හා එහි මේසයේ උඩ තවිවුම් සේදවීමටත්;

(c) කිරි පවිත්‍රයේ සියලුම කොටස් හා එහි අවට ප්‍රදේශයත් කාණන් ගුඩපත්‍රව හා මොහා තැබියයක තබාගැනීමටත්;

(d) අවුරුණෙන් දවසකට වරක් බැගින්වත් සියලුම කොටස් කුණුකසළ, මුත්‍ර හා සේදියන වතුර කිරි පවිත්‍රයෙන් ඉවත්කොට මිහාජනයාව අවිකිරයක් නොවන යම් පරිද්දෙකින් සුදුසු කරම් ඇතව ගෙනගොස් සුදුස්සක් කරවීමටත්;

(e) තණකොළ හෝ පිදුරු හැර වෙනත් සියලුම ගම් ආහාර මියන්ට ඇතුළුවිය නොහැකි සුදුසු භාජනවල තැන්පත් කරවීමටත්;

(f) කිරි පවිත්‍රයේ පාවිච්චිකරන හෝ ඊට අයත් සියලුම උපකරණ, ලී බඩු හා වෙනත් ද්‍රව්‍ය පිරිසිදුව තබාගැනීමටත්;

මිනුකරන සියලුම විධිවිධාන හැරුස්වීමට වගාකිලාගත යුතුයි.

65. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් :—

(a) ඉතා හොඳට ගුඩපවිත්‍ර නොකරනලද කිසිම භාජනයකට කිරි මත්කිරීමට;

(b) විදුරු පිගන් මැවී, ඔපදමනලද පිගන් මැවී, ඇලුමිනියම් හෝ ගැල්වනයිස් කරපු යකඩ යන මේවායින් කෙනෙකුගේ භාජනයකට හැර වෙන කිසිම භාජනයකට කිරි මත්කර තැබීමට;

(c) කිරි මත්කර තබාගැනීමට පාවිච්චිකරනු ලබන මොනම භාජනයක්වත් කිරි කාමරයෙන් පිට කිසිම තැනක තැබීමට;

(d) කිරිදෙවන වෙලාව එක්කම ඊට මත්තෙන් එලදෙනගේ මුරුල්ල හා තනපුවු හොඳට ගුඩපවිත්‍රකොට පිරිසිදුවූ පෙනෙන රෙද්දකින් පිංදමන ලදුවද, කිරිදෙවන අතගේ අත් හොඳට හෝදා පිරිසිදුකරන ලදුවද තිබෙනොත් මිස තැත්නම් වෙළඳුම පිණිස කිරි ලබාගැනීමට කිසිම එලදෙනකුගෙන් කිරිදෙවීමට;

(e) විකිණීමට අදහස්කරන කිරි, කිරි කාමරයේ හැර වෙන ස්ථානයක තබා තිබීමට; හා

(f) මොනම කාරණයක් නිසාවත් කිසිම සතකුට හෝ කුරුල්ලකුට කිරි කාමරයට ඇතුල්වීමට හෝ එහි නතරවී සිටීමට;

හැරුස්වීම හෝ ඉඩදීම නොකළ යුතුයි.

66. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් කිරි පවිත්‍රයේ කටයුතු සඳහා හැපයිය යුත්තේ ප්‍රධානතුමා විසින් අනුමතකරනලද යම් ජලගම්පාදන ක්‍රමයකින් ලබාගත් මිතුර පමණකි.

67. (1) කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් කිරි පවිත්‍රයේ පාවිච්චිකරන කිසිම කිරි භාජනයක්, වෙඩරු හැඳන යන්ත්‍රයක්, සොදන වෙත්කරන යන්ත්‍රයක් හෝ වෙන උපකරණයක් කිරි පවිත්‍රයේ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තකට පාවිච්චි කිරීමට ඉඩනොදිය යුතුවාත් හැර, එබඳු හැම භාජනයක්, වෙඩරු හැඳන යන්ත්‍රයක්, සොදන වෙත්කරන යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් එය පාවිච්චිකරනු ලබන එක් එක් වාරයෙන් පසුව පළවූව ඇල්මිනියරෙන්ද, දෙවනුව උණුවතුරෙන් හා හෝබාමිලින්ද, අවසානයේදී උණුකර තිබිනලද මිතුරෙන්ද සේදීමට හැරුස්විය යුතුයි.

(2) කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් භාජන ශුද්ධ පවිත්‍ර කිරීමට සොදන මුරුසු හා කිරි පවිත්‍රයේ වෙනත් උපකරණ පාවිච්චිකළ හැම වාරයකටම පසුව මිනිත්තු දහයක් තැම්බීමට හැරුස්විය යුතුයි.

68. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් කිරිපවිත්‍රයේ තිබෙන කිරි සහිත හැම භාජනයක්ම පිරිසිදු වැස්මකින් හෝ සියනකින් සුදුසු පරිදි අරක්ෂාකිරීමට හැරුස්විය යුතුවාත් හැර කිරි ගෙනයාමේදී එය නරක්වීම වළක්වාලීමට සියලු විධිවිධානද යෙදිය යුතුයි,

69. කිරි පවිත්‍රයක බලපත්‍රකාරයා විසින් කිරි ගබඩාකිරීමේ හා පිළියෙළකිරීමේ කටයුත්තකින් බාහිරවූ කිසිම කටයුත්තක් සඳහා කිරි කාමරය පාවිච්චිකිරීම හෝ පාවිච්චිකිරීමට ඉඩදීම හෝ නොකළ යුතුයි.

70. බෝමන රෝගයකින් හෝ හෙම රෝගයකින් හෝ වසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ පෙළුනාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කිසිවකුට ලගදී සාත්තුකිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනකුට ඒ රෝගය බෝවීමට හා රෝගබීජයන් බෝරණු රැබීමට හේතුවන කාලසීමාවේත් සඳහනක් කිරි පවිත්‍රයේ හෝ කිරිකාමරයට ඇතුල්වීමටවත් කිරි පිළියෙළ කිරීමේ, විකිණීමේ හෝ ගෙනයෑමේ කටයුත්තකට සහභාගිවීමටවත් බලපත්‍රකාරයා හෝ කිරිපවිත්‍රය හෝ කිරි කාමරය භාරව සිටින කිසිවකු විසින් ඉඩනොදිය යුතුයි.

71. කිරිපවිත්‍රයේ රක්ෂාවෙහි නියුක්ත අයවලුන් අතර යම් බෝවන රෝගයක්, හෙම රෝගයක් හෝ වසංගත රෝගයක් හටගැනුණොත් හෝ ඒ පිළිබඳව යම් සැකයක් පැණනැංගොත් බලපත්‍රකාරයා විසින් ඒ බව වහාම ප්‍රධානතුමාට දැනුම්දිය යුතුයි.

72. කිරිපවිත්‍රයක බලපත්‍රකාරයා විසින් සාගරරෝගයෙන්, දරුණුලෙස මුරුල්ල දුම්ල්ලෙන්, කුර හා කට ලෙඩින් ඇත්තෑන්ස් නම් යම් වසංගත රෝගයෙන් හෝ මුරුල්ලේ හැඳෙන "ඇක්ටිනොමිකෝසිස්" නම් රෝගයෙන් පෙළෙන කිසිම එලදෙනකුගෙන් ලත් කිරි විකිණීම හෝ විකිණීමට හැරුස්වීම හෝ විකිණීමට ඉඩදීම, හෝ මිනුහයන්ගේ පාවිච්චිය සඳහා විකිණීමට අදහස්කරන කිරි මිලට එවැනි කිරි එකතුකිරීම හෝ එකතුකිරීමට හැරුස්වීම හෝ එකතුකිරීමට ඉඩදීම හෝ නොකළ යුතුයි.

73. ප්‍රධානතුමා විසින් අවුරුදුපතා හැම බලපත්‍රලත් කිරි පවිත්‍රයකම අධිකාරයා වෙත ඔහු යටතේ රක්ෂාවෙහි නියුක්ත එක් එක් කිරිමේලෙන්ද වෙනුවෙන් ඒ අයගේ නම හා මහපවඇඟිල්ලේ ඡලකුණත් බලපත්‍රකාරයාගේ නමින් කිරි පවිත්‍රයේ ලියාපදිංචිකිරීමේ අඛණ්ඩයක් අඛණ්ඩ ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් බැගින් තිබුත්කළ යුතුයි. ප්‍රධානතුමා විසින් බලය පවරනලද වෛද්‍ය නිලධාරියකු විසින් ඒ අය පරීක්ෂාකර බලනුරුම් ඔහු බෝවන රෝගයකින්, වසංගත රෝගයකින් හෝ හෙම රෝගයකින් නොපෙළන්නකු යයි සහතිකකරනු ලබනතුරු එබඳු ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් තිබුත්කරනු නොලැබේ. එබඳු ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් මෙහි කෙනකුට පැවරිය නොහැකිය.

74. (1) ප්‍රධානතුමා විසින් හෝ ප්‍රධානතුමා විසින් ලියාපදිංචි කින් බලය පවරනලද ඕනෑම නිලධාරියකු විසින් ඕනෑම බලපත්‍ර ලත් කිරිපවිත්‍රයකින් හෝ බලපත්‍ර ලත් කිරිපවිත්‍රයකින් කිරි විකුණන්නාවූ, කිරි විකිණීමට තබන්නාවූ, හෝ ඇවිදිමින් කිරි විකුණන්නාවූ හෝ කිරි භාරදෙන්න ගෙනයන්නාවූ ඕනෑම කෙනකුගෙන් හෝ එයට නියම මුදල හෙවත් මිලගාකර බැලීම පිණිස කිරි හැම්පලයක් ඕනෑම වේලාවක ඉල්ලා ඊට වැටහෙන මුදල හෙවත් ලබාගත හැකිය.

(2) කිසිම කිරිපවිත්‍රයක බලපත්‍රකාරයකු විසින්, ලියාපදිංචි කරනුලැබූ කිරි වෙළෙන්දකු විසින්, හෝ වෙනත් අයකු විසින් නිර්දිප්‍රකාර (1) වැනි ඡේදය යටතේ කරනලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතුයි.

75. එක එලදෙනකුගෙන් ලත් කිරි විකිණීමට හෝ වෙළඳුම පිණිස ඉදිරිපත්කිරීමට කැමති හැම අයකු විසින්ම කලින් ලියාපදිංචිකළ කිරි සපයන්නකු මගෙයක් කාගේ හෝ පොත්මල තවත්කරවාගත යුතුයි.

76. ප්‍රධානතුමා විසින් ලියාපදිංචිකින් බලය පවරනලද වෛද්‍ය නිලධාරියකු විසින් එලදෙන, ස්ථානය හා උපකරණ පරීක්ෂාකර බලා එබඳු අයකු ලියාපදිංචි නොකළ යුතුයයි යෝජනා කරන්නේ නම් ප්‍රධානතුමාට ඒ අය කිරි සපයන්නකු වශයෙන් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන තැකිය.

77. ලියාපදිංචිකරනු ලැබූ හැම කිරි සපයන්නකු විසින්ම—

(a) තවමත්වූව, එහි පාවිච්චිකරන උපකරණ හා වෙනත් දේවල් ශුද්ධ පවිත්‍රව තබා ගැනීමටත්;

(b) කිරිදෙවන අය හා කිරි බෙදූ හරිත අය රෝගයකින් නොපෙළෙන අයවන බවටත්;

අවශ්‍ය සියලුම විධිවිධාන හා පිළිවෙත් යොදා ගැනීමට වග බලාගත යුතුයි.

78. කිරිදෙවන වේලාව එක්කම ඊට මත්තෙන් එලදෙනගේ මුරුල්ල හා තනපුවු හොඳට ශුද්ධ පවිත්‍රකොට පිරිසිදුවූ පෙනෙන රෙද්දකින් හෝදා කිරිදෙවන අතගේ අත් හොඳට හෝදා පිරිසිදු කරගෙනාද තිබෙනම් මිස තැත්නම් ලියාපදිංචි කරනලද කිසිම කිරි සපයන්නකු විසින් කිසිම එලදෙනකුගෙන් කිරි දෙවීමට හැරුස්වීම හොඳොත් ඉඩදීම නොකළ යුතුයි.

79. ලියාපදිංචි කළ කිරි සපයන්නකු විසින් ඉල්ලීමක්කොට ප්‍රධානතුමිගෙන් නොමිලයේ ලබාගත් හලුතා පැතිමේ කාඩ් පත්‍රයක් දරන්නේ නම් මිස හැන්නම් කිසිවකු විසින් ලියාපදිංචි කළ කිරි සපයන්නකු වෙනුවෙන් කිරි බෙදා හැරිය යුතු නැත.

80. (1) ලියාපදිංචි කරගෙන ඇති කිරි සපයන්නකු විසින්ම කිරි එකතුකිරීමට, වත්කර කැවීමට හෝ බෙදාහැරීමට පෞද්ගලික කරන ඇති භාජනයක්ම ඒ භාජනය පෞද්ගලිකකරණ එක් එක් වාරයට පසුව පළමුව ඇල්වතුරෙන්ද, දෙවනුව උණුවතුරෙන් හා හෝබාවලින්ද අවශ්‍යතා විශයෙන් උණුකර නිර්වතලද වතුරෙන්ද සේදීමට හැරෑන්විය යුතුයි.

81. (1) යම් ප්‍රදේශයේ ඇතුළත යම් ස්ථානයක තමා, ඒ ප්‍රදේශයේ පිහිටන නිපදවනලද කිරි විකිණීමට බලාපොරොත්තු වන ඇති අයකුම විසින්ම, කිරි බෙදාහරින්නකු වශයෙන් නම් කෙරෙන්නා සහතිකය පොත්මට ලියාපදිංචිකරවාගත යුතුයි.

(2) එබඳු ලියාපදිංචිකිරීමක් සඳහා කිසිම ගාස්තුවක් හෝ මුදලක් අයකරනු නොලැබේ.

82. ලියාපදිංචිකළ ඇති කිරි බෙදාහරින්නකු විසින්ම ඒ බෙදාහරින්නා යටතේ කිරි විකිණීම හෝ බෙදාහැරීම සඳහා රක්ෂාවේ සොදුගෙන තිබෙන එක් එක් කිරිවෙළෙන්ද වෙනුවෙන් ප්‍රධානතුමා ලවා අවුරුදු පතා ලියාපදිංචිකිරීම් කාඩ්පත් නිකුත්කරවාගත යුතුයි.

83. (1) කිරි නිපදවනු ලබන කිරිපිළිය පිහිටා ඇති ප්‍රදේශයෙහි විධිවූ ප්‍රකාර සංස්ථාපිත ප්‍රදේශාධිකාරී සභාවේ ප්‍රධානතුමා විසින් 81 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ කිරිපිළිය පරීක්ෂාකර බැලීමෙන් පසුව යම් අයකු පිළිබඳ කිරි බෙදාහරින්නකු විශයෙන් ලියාපදිංචිකිරීමට නුසුදුසුයයි සැලකර සිටින්නේ නම් ප්‍රධානතුමා විසින් එබඳු අයකු මුලේ ලියාපදිංචි කිරීමට නුසුදුවන්නයයි ප්‍රකාශකරන්න පැකිලි.

(2) යම් බෝමෙන රෝගයකින්, වසංගත රෝගයකින් හෝ යම් රෝගයකින් නොරව සිටින්නේය කියා ප්‍රධානතුමා විසින් නම්කරනලද වෛද්‍ය නිලධාරියකු විසින් පරීක්ෂාකර බලා සහතික කරනු ලබන 81 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ කිරිපිළිය පරීක්ෂාකර බැලීමට එලෙසම ප්‍රතික්ෂේපකළ හැකිය.

84. 82 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ ප්‍රධානතුමා විසින් නිකුත්කරනු ලබන ඇති ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයකම පහත සඳහන් කරුණු අඩංගුවිය යුතුයි:—

(a) ස්වාමියාගේ නම හා ලියාපදිංචිකිරීමේ අංකය;

(b) වෙළෙන්දාගේ නම හා ඔහුගේ මිනිපවැඩිල්ලේ ස්ථානය.

85. ලියාපදිංචිකරනු ලැබූ ඇති කිරිවෙළෙන්දකු විසින්ම හා කිරිවිකිණීම පිළිබඳවූ අවුරුදු ව්‍යවස්ථාවේ හලුතා පැතීමේ කාඩ්පත්‍රයක් දරන ඇති අයකු විසින්ම විකිණීමට කිරි නෙසයා බෙදී ඉදිරිපත්කිරීමෙදී හෝ ඇවිද විකිණීමෙදී හෝ ලියාපදිංචිකිරීමේ පත්‍රය හෝ හලුතා පැතීමේ කාඩ්පත්‍රය තමා රැස තබාගන යුතුවාක් හැර ප්‍රධානතුමා විසින් විධිවූ පරිදි ඒ සඳහා මිලය පවරනලද නිලධාරියකු විසින් එසේ පත්කුමකරන්ව තිබෙන විනා ඉල්ලා සිටීමට එය ඉදිරිපත්කළ යුතුද වන්නේය.

86. කිසිවකු විසින් යම් ප්‍රදේශය ඇතුළත:—

(a) "Skimmed Milk" යන ඉංග්‍රීසි පදය හා එහි සිංහල, දෙමළ පරිවර්තනයන් ලියනලද ලේබලයක් හිට අලවන ලද භාජනයක වත්කරනු ලැබේද, විකුණන අවස්ථාවේදී ඒ යොදය ඉවත්කරනලද කිරි යනුවෙන් ප්‍රකාශකරනු ලැබේද නිසාවෙන් මිස හැන්නම් යොදය ඉවත්කරන ලද කිරි; හෝ

(b) මිතුර හෝ වෙනත් යම් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් මිශ්‍රකරන ලද්දවූ කිරි; හෝ

(c) දියසිරුව නොපවත්නා සුළු යම්කිසි ඝන්ධ ද්‍රව්‍යයකින් සුදුසු පරිදි නොවශතලද කවවල් ඇති බෝතලවල දමනලද කිරි;

විකිණීමට තැබීම, විකිණීමට ඉදිරිපත් කිරීම හෝ බෙදාහැරීම, විකිණීමට හෝ ඇවිද විකිණීම හෝ නොකළ යුතුයි. එසේත් නේ හෝ කෝපි කඩයක හෝ බිස්කඩයක ඒ ස්ථානයේදීම පැවිවිකිරීම පිණිස නේ, කෝපි හෝ නොකෝවා මිශ්‍රකරන ලද කිරි මේ අනුරූ ව්‍යවස්ථාව සඳහා මිශ්‍ර කිරීමක් විශයෙන් සලකනු නොලැබේ.

87. කිරි පිළිය බලපත්‍රකාරයා විසින් කිරි පිළිය හා කිරි විකිණීම පිළිබඳවූ මේ අනුරූ ව්‍යවස්ථාවල සිංහල පිටපතක් හා බලපත්‍රය රැගෙනගොස් කිරි පිළිය තුළ කාටත් පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුයි.

වෙළඳපලවල් හා කඩපලම්

88. මිනැම ස්ථානයක වෙළඳපලක් පිහිටා තැනැප්ම එකක අති මිත්‍රභෝජනක කටයුත්තක් ඇතුළත්වූ ප්‍රදේශය ඒ වෙළඳපලට අයිතිවූ ප්‍රදේශයක් බව මෙයින් ප්‍රකාශකරනු ලැබේ.

89. මිනැම ස්ථානයක වෙළඳපලකට අයිතිවූ ප්‍රදේශය ඇතුළත ඒ වෙළඳපල විවෘතව පවත්නා කාලය තුළ ඒ ස්ථානයේ වෙළඳපලේ තබාගිය වෙක කිසිම ස්ථානයක තබා කිසිවකු විසින් කිසිගමක එලවලු, පලතුරු, මාලු, මස් හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීමට තැබීම හෝ විකිණීමට ඉදිරිපත්කිරීම හෝ නොකළ යුතුයි.

එහෙත් මේ අනුරූ ව්‍යවස්ථාවේ ඉහත සඳහන් විධිවිධාන:—

(a) කිසිම විශයෙක් වෙළඳපලකිරීම පිණිස ස්ථිර ස්ථානයක් නොමැතිවූ හෝ ඒ සඳහා මිනිපවැඩිල් අයිතිව හෝ වෙනත් පොදු ස්ථානවල ස්ථිර ස්ථාන පිහිටුවාගෙන නොමැතිවූ හෝ ඇවිදිමින් ඔවුන් විකුණන වෙළඳුන් විසින් එලවලු හෝ පලතුරු විකිණීම;

(b) බස් කඩයක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් ඒ කඩේ ඇතුළත අනුභවකිරීම සඳහා ඉදිරිවට කෙසෙල්කෙඩි හෝ වෙනත් පලතුරු විකිණීම;

(c) කිසිවකු විසින් කුරුඳුමිරිස් විකිණීම;

යන මේ වෙළඳපලට සම්බන්ධකමක් නැත.

90. කාර්‍ය සභාව විසින් අනුමත කරනලද සැසියේ යම් යම් දවස්වල පෙ. ව. 6 සිට ප. ව. 6 දක්වා ඇති යම්බඳ වෙළඳපලක්ම විවෘතකර තැබිය යුතුයි.

91. කිසියම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය වර්ගයක් වෙළඳකිරීම පිණිස පමණක්ය කියා කාර්‍ය සභාව විසින් යම්බඳ වෙළඳපලක කිසියම් කොටසක් වෙන්කර තිබෙන කල්හි කිසිවකු විසින්—

(a) එසේ වෙන්කරනලද කොටසේ තබා මිස වෙළඳපලේ හෝ කඩපලේ වෙන කිසිම ස්ථානයක තබා එබඳු ද්‍රව්‍යයක් හෝ එබඳු ද්‍රව්‍ය වර්ගයක් විකිණීම හෝ විකිණීමට තැබීම; හෝ

(b) එසේ වෙන්කරනලද කොටසේ තබා වෙනත් ද්‍රව්‍යයක් හෝ වෙනත් ද්‍රව්‍ය වර්ගයක් විකිණීම හෝ විකිණීමට තැබීම; හෝ

නොකළ යුතුයි.

92. කිසියම් යම්බඳ වෙළඳපලක කිසියම් කඩබස්කියක්, බංකුවක්, හෝ වෙනත් ස්ථානයක් පාවිච්චිකිරීම සම්බන්ධයෙන් පහත දක්වන ගණන් අනුව කාන්තුවක් අයකළ යුතුයි.

මාලු වෙළඳපලේ ඇති හකරුන් අඩියක ප්‍රමාණයට—

	දවසකට,
(a) පෙරවරු 6 සිට පස්වරු 1.30 දක්වා	.. රු 10
(b) පස්වරු 1.30 සිට පස්වරු 6 දක්වා	.. රු 20

එලවලු හා මාලු වෙළඳපලේ හකරුන් අඩි හතරක ප්‍රමාණයට—

	දවසකට
(a) පෙරවරු 6 සිට පස්වරු 1.30 දක්වා	.. රු 05
(b) පස්වරු 1.30 සිට පස්වරු 6 දක්වා	.. රු 10

මේ ප්‍රසිද්ධ වෙන්දේසියේ දිනා යම් වෙළඳ ද්‍රව්‍යයක් විකිණීම සඳහා යම් කඩකාමරයක් හෝ ස්ථානයක් පාවිච්චිකිරීම වෙනුවෙන්වූ කාන්තුව එකී වෙළඳුමෙන් රැකෙන ලාභ මුදලින් සියයට දෙකකි.

93. ඒ සඳහා ප්‍රධානතුමා විසින් හෝ ඔහුගේ බලයයටත් හෝ නිකුත්කරනු ලැබූ අවසරපත්‍රයක් ඇතුළ හා එබඳු අවසර පත්‍රයක කොන්දේසිවලට හා නියමයන්ට එකඟව මිස කිසිවකු විසින් යම්බඳ වෙළඳපලක හෝ කඩපලක කිසිම කඩබස්කියක්, බංකුවක් හෝ වෙනත් ස්ථානයක් පාවිච්චි නොකළ යුතුයි. එබඳු ඇති අවසරපත්‍රයක්ම එකී සඳහන්කර තිබෙන දිනයට අවසානවන්නේය.

94. 92 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ පෙනිය යුතුවූ කාන්තුව ප්‍රධානතුමාට හෝ ප්‍රධානතුමා විසින් බලය පවරනු ලැබූ වෙනත් කෙනෙකුට පෙනිය යුතුවාක් හැර තමාගෙන් ලැබියයුතුවූ කාන්තුව පෙවහතුරු 93 වැනි අනුරූ ව්‍යවස්ථාව යටතේ කිසිවකුට අවසරපත්‍රයක් නිකුත් නොකළ යුතුයි.

95. ඒ ඒ වෙළඳපල පාවිච්චිකිරීම හා ප්‍රතිපත්තියට හැකිම සම්බන්ධයෙන් අයකළ හැකිවූ කාන්තු දුන්මෙන දුන්විමක් ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂාවලින් පිළිගෙලකොට ප්‍රධානතුමා විසින් එක් එක් යම්බඳ වෙළඳපලේ කියලදෙනාටම පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුවාත් හැර ඒ දුන්විමේ නියමකරනලද ගණන්වලට වැඩිවූ මොනම කාන්තුවක්වත් කිසිවකු විසින් ඉල්ලීම හෝ භාරගැනීම නොකළ යුතුයි.

96. සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමා සමග සාකච්ඡා කොට කිසියම් විශෙෂ ආහාර ද්‍රව්‍යයක් මිශ්‍රණයාගේ පාවිච්චියට හෝ අනුභවයට අත්තරායදායක හෝ විෂදායක කියා කෘෂ්‍ය සභාව විසින් ඒත්තුගෙන තිබෙන කලර විවෙකදී වුවත් අණ බෙර ගැස්වීමෙන් හෝ වෙනත් ඇසෙන විධියකින් දැනුම්දීමෙන් පසු කෘෂ්‍ය සභාව ව සුදුසුයයි සැලසෙන්නාවූ කාලපරිච්ඡේදයකට ඕනෑම සම්බද්ධ වෙළඳුම්පලකට හෝ කඩපලකට එකී ආහාර ද්‍රව්‍යය ගෙනවීම හා එකී තබා විකිණීම සහනකිරීමට කෘෂ්‍ය සභාවට නිතිප්‍රකාර බලය තිබේ.

97. කිසියම් සම්බද්ධ වෙළඳුම්පලක් හෝ කඩපලක් ඇතුළත කිසිමිනු විසින්—

(a) බලපත්‍රයක් මස්බවුවකදී හෝ හරිමි මස්බුවකදී හැර මෙහෙක් මොනම ස්ථානයකදීවත් මරණු ලැබූ කිසිම සතෙකුගේ මළකුණක් හෝ මස්; හා

(b) කෘෂ්‍ය සභාව විසින් හෝ කෘෂ්‍ය සභාව විසින් සම්පාදනය කරනලද කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ විකිණීම හෝ තබාගැනීම සහනකිරනලද කිසිම ද්‍රව්‍යයක්;

වෙළඳවිකිරීම හෝ වෙළඳම පිණිස තබාගැනීම නොකළ යුතුයි. එහෙත් අසිස්දඟා ශීතකරනලද මස් හෝ දඩමස් හෝ මෘදු විකිණීම සම්බන්ධයෙන් මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත සඳහන් කිසිමයක් අදාළ නොවේ.

98. බෝවෙන රෝගයකින්, වසංගත රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන්නාවූ හෝ පෙළුනාවූ හෝ එකිනු රෝගයකින් පෙළෙන කෙනෙකුව සෘජුකිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනෙකු විසින් එකී රෝගය බෝවීමට හා රෝගජීජයක් මෝරණු ලැබීමට සහවන කාලසීමාවක් පසුවන තෙක්, සම්බද්ධ වෙළඳුම්පලක කඩබක්කියක්, හෝ බංකුවක් හෝ වෙනත් ස්ථානයක් පාවිච්චිකිරීම හෝ එහි මොනම ද්‍රව්‍යයක්වත් විකිණීම සඳහා තැබීම හෝ නොකළ යුතුයි.

99. සමේ කිසිම වෙළඳුම්පලක් පාවිච්චිකරන කිසිවකු විසින්—

(1) ඒ වෙළඳුම්පල තුළ හෝ එකී අවට නොකිල්ලුණු විධියකට තැබීම හෝ කරදරයකට හේතුවන මොනම දෙයක් කිරීම; හෝ

(2) එබඳු යම් වෙළඳුම්පලක් ඇතුළත කෑම බීම ඉවීමෙ කවයුතුකිරීම; හෝ

(3) තමා තැන හරිතැටි සතුටුදායක මිත්‍රරයක් දිය නොතැකිව සමය 6ට වෙළඳුම්කිරීම පිළිබඳ කවයුතු අවධාන කරනු ලැබුවාට පසු ඒ වෙළඳුම්පලේ නතුරම් සිටීම හෝ එකී නිකරුණේ ඇවිදීම; හෝ

(4) ඒ කඩපලේ හෝ එකී අවට ඇති කෘෂ්‍ය සභාව සහතකවූ ගොඩනැගිල්ලක, කඩකාමරවල හෝ ලාම්පුමල කිසිම කොටසක හෝ වෙනයම් දේපලකට හෝ අලාභයක් කිරීම හෝ කිසියම් පලුදුද්දක්කිරීම හෝ ඒ වෙළඳුම් පලේ කිබෙන වතුර නරක්කිරීම හෝ අපිරිසිදු කිරීම; හෝ

(5) ඒ වෙළඳුම්පලට අයිති ගොඩනැගිල්ලක භූමිභාගයේ කොටසක් කොකි විධියකින්වත් කොටුකිරීම හෝ එකී කලක් පවතින ලෙස පැලැල්ලක්, මිටක් හෝ මෙන යම් දෙයක් තැබීම; හෝ

(6) ප්‍රධානතුමාගේ විශෙෂ අවසරයක් නොමැතිව සමය 6 සිට උදේ 6 දක්වා කාලය තුළදී ඒ කඩපල ඇතුළත කිසිම බිබුළුවීමක් කැබීම; හෝ

(7) එකී වෙළඳුම මිණිස ප්‍රදර්ශනය කරනු ලබන පලතුරු එලවලු, මස්, දඩමස්, මෘදු හෝ වෙනත් ආහාර වර්ග අපිරිසිදුවූ හෝ සෞඛ්‍යසම්පන්න නොවූ කිසිම ස්ථාන තුළ තැබීම; හෝ

(8) පිරිසිදුලෙසටත්, මැස්සන්ට පැමිණිය නොහැකි ලෙසටත් කිසිපරිදි හාදනලද පෙට්ටිවල හැබෑ මිස වසනු ලැබූ හෝ නොලැබූ කිසිම ආහාර ද්‍රව්‍යයක් විකිණීමට තැබීම;

නොකළ යුතුයි.

100. සම්බද්ධ වෙළඳුම්පලක හෝ කඩපලක ඕනෑම කඩබක්කියක් පාවිච්චිකරන හෝ එකී තතුරවී සිටින යම් අයකු විසින්ම ඒ කඩබක්කිය තුළ හෝ ඒ අසල හොඳින් වැසෙන පියනක් හෝ වැස්මක් ඇතිවූද මැස්සන්ට ඇතුල්විය නොහැකි වූද භාජනයක් තබා ඒ භාජනයට සියලුම කුණුරොඳු ආදිය දමිය යුතුයි.

101. කිසිම සම්බද්ධ වෙළඳුම්පලක හෝ කඩපලක භූමිභාගයෙකි කිසිවකු විසින් දූවිලි හෝ කුණුරොඳු, කිසියම් ස්ථානයේ ඇව හෝ හම්, හෝ ඕනෑම සෞඛ්‍යයට හානිවිය හැකිවූ හෝ අප්‍රියවිය හැකිවූ වෙනත් කිසිම ද්‍රව්‍යයක් විසිකර නොදැමිය යුතුයි.

102. සම්බද්ධ වෙළඳුම්පලක් හෝ එවිට සිටින අයට හෝ සම්බද්ධ වෙළඳුම්පලක කවයුතු බලාකරවීමට හෝ එකී ගෘහස්ථ හා කුලී අයකිරීමට හෝ එකී ගෘහය ආරක්ෂාකොට එහි ගුණ පවත්වා තබා ගැනීමට හෝ කෘෂ්‍ය සභාව විසින් පත්කරනලද මෙහෙත් අයකුව නිතිප්‍රකාර තම රාජකාරිය ඉටුකිරීමේදී කිසිවකු විසින් ඒව බාධාමක් හෝ විරුද්ධකමක් නොපෑ යුතුයි.

103. රථවාහනයක් පදවන්නකු විසින් ඒ රථවාහනය සම්බද්ධ වෙළඳුම්පලකට අයිති භූමිභාගය ඇතුළත හෝ එහි අසින් රථවාහනයෙන් බිඳු බැසීමට හෝ ඒව බඳු පැවවීමට වුවමනාවිට බිඳා දීමේ කාලයක් නවත්වා නොතැබිය යුතුයි.

104. සම්බද්ධ වෙළඳුම්පලක් හෝ කඩපලක් පිහිටුවීම හෝ කාවකාලික විශෙෂයක් විසා දුම්ම ගැන අණබෙර ගැස්වීමෙන් හෝ කමාව සුදුසු යයි සැලසෙන වෙනත් ප්‍රකාරයකින් ප්‍රධානතුමා විසින් කල් ඇතුව දැනුම්දිය යුතුයි.

පුද්ගලික වෙළඳුම්පලවල් හා කඩපලවල්

105. යම්කිසි (ප්‍රමිබ) වෙළඳුම්පලකට අයිතිවූ ප්‍රදේශයක් ඇතුළත කිසිම පුද්ගලික වෙළඳුම්පලක් හෝ කඩපලක් පිහිටුවීම හෝ පවත්වාගෙනයාම නොකළ යුතුයි.

106. (1) ඒ සඳහා ප්‍රධානතුමා විසින් නිකුත්කරනලද බලපත්‍රයක් මිට මිස හැත්තම් (වෙළඳුම්පලකට අයිති ප්‍රදේශයකින් බාහිරවූ) කිසිම ප්‍රදේශයක් ඇතුළත කිසිම පුද්ගලික වෙළඳුම්පලක් හෝ කඩපලක් පිහිටුවීම හෝ පවත්වාගෙනයාම නොකළ යුතුයි.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත්කරනු ලබන සෑම බලපත්‍රයක්ම—

(a) මිට යාකොට ඇති A උප ලේඛනයේ සඳහන් ආකාරයේ ප්‍රකාරයට විය යුතුයි;

(b) එහි දැක්වෙන කොන්දේසිවලට යටත්විය යුතුයි;

(c) 108 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවලංගු නොකරනලද්දේ නම් එය නිකුත්කරනලද අවුරුද්දේ දෙසැම්බර් මස නිස්එක්වැනිදාට අවසාන විය යුතුයි;

(3) 1 වැනි ඡේදය යටතේ නිකුත්කරනු ලබන එක් ශක් බලපත්‍රය වෙනුවෙන්වූ ගාස්තුව රුපියල් එකසියයකි.

107. පුද්ගලික වෙළඳුම්පලක් හෝ කඩපලක් පිහිටුවීමට බලාපොරොත්තුවන භූමිභාගය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමා විසින් අනුමතකරනු ලබනතුරු එකී පුද්ගලික වෙළඳුම්පලක් හෝ කඩපලක් පිහිටුවීමට හෝ පවත්වාගෙනයාමට බලපත්‍රයක් ලැබීමට කිසිවකුට අයිතිවාසිකමක් නැත.

108. මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ බලපත්‍රයේ කොන්දේසිවලින් යම් කොන්දේසියක් හෝ කඩකිරීම නිසා, සම්බද්ධ උසාවියකින් බලපත්‍රකාරයකු දෙමෙහි වරව හෝ ඒව අනතුරුව මරදකාරයකු කොට විනිශ්චයකරනු ලැබුවිට 106 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත්කරනලද බලපත්‍රයක් ඒ උසාවිය විසින් අවලංගුකළ හැකිය. එසේ අවලංගුකිරීම හේතුකොටගෙන ඒ බලපත්‍රකාරයාට කිසියම් අලාභයක් අයකර ගැනීමට අයිතිවාසිකමක් නැත්තේය.

109. සම්බද්ධ උසාවියකින් කලින් බලපත්‍රයක් අවලංගුකරනු ලැබූ කිසිවකුට ප්‍රධානතුමා විසින් 106 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත්කිරීම ප්‍රතික්ෂේපකළ හැකිය.

110. සුදුසුවූ හැම කල්හිම ප්‍රධානතුමා විසින් හෝ සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරීතුමා විසින් හෝ සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් වෙනත් ඕනෑම කෙනකු විසින් ඕනෑම වෙළඳුම්පලකට හෝ කඩපලකට ඇතුල්වී ඒ වෙළඳුම්පල හෝ කඩපල හෝ එකී වෙළඳුම්ව තබා තිබෙන නොගොත් ප්‍රදර්ශනය කර තිබෙන ඕනෑම ආහාර ද්‍රව්‍යයක් පරීක්ෂාකිරීම නිත්‍යානුකූල වන්නේය. තවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ තම රාජකාරිය ඉටුකිරීමේදී පූර්වෝක්ත කවර නිලධාරියකුටවත් කිසිවකු විසින් බාධාකිරීම හෝ විරුද්ධකමක් පෑම හෝ නොකළ යුතුයි.

අප්‍රියවූ හා අන්තරායදායකවූ කර්මාන්ත

111. (1) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රියවූ කර්මාන්ත විශෙෂයෙන් සැලකිය යුතුයි:—

(a) ගඩොල් සෑදීම;

(b) පොල්ලෙලි පෙගවීම විකිණීම කොටුවක් තබාගැනීම.

(2) පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායකවූ කර්මාන්ත විශෙෂයෙන් සැලකිය යුතුයි—

(a) කොප්පරා සෑදීම හෝ ගබඩාකිරීම;

(b) යනතුසුත්‍රාදියෙන් කොල් කිරීම;

(c) කොල් මිශලා ගකාස්කිරීම;

(d) ජල බලයෙන්, විෂ්ප බලයෙන් හෝ වෙනත් ශාන්ත්‍රික බලයකින් ලී කඳන් හෝ දුව දඬු ඉරීම;

(e) කෝබා, රුමිනම්, ආදී කිසිම මිටි සෑදීම;

(f) පිදුරු ගබඩාකිරීම;

(g) කිසිපෙට්ටි කර්මාන්තය;

(h) එක හෝ කිසියකට වඩා අලු හුණු ගබඩාකිරීම;

(i) කණුක්ගල්, බොරලු හෝ කරගල් ලබාගැනීමට ගල් වළවල් හෑරීම.

(3) පහත සඳහන් කර්මාන්ත අප්‍රියවූ හා අන්තරායදායකවූ කර්මාන්ත විශෙෂයෙන් සැලකිය යුතුයි:—

ගබොල් හෝ උලු පිළිවීම

112. (1) සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ රෙජිස්ට්‍රාර් පිළිබඳ ප්‍රධානතුමා විසින් ඒ සඳහා නිකුත්කරනලද බලපත්‍රයක් දරන්නේනම් මිස නැත්නම් කිසිවකු විසින් අප්‍රියවූ කිසියම් කර්මාන්තයක් හෝ අන්තරායදායකවූ කිසියම් කර්මාන්තයක් කරගෙනයාම් නොකළ යුතුයි.

(2) 121 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවලංගු නොකරන ලද්දේනම් සෑම බලපත්‍රයක්ම එය නිකුත්කරනු ලැබූ අවුරුද්දේදී දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අවසාන වන්නේය.

113. (1) අප්‍රියවූ කිසියම් කර්මාන්තයක් හෝ අන්තරායදායකවූ කිසියම් කර්මාන්තයක් කරගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් අනුමත කරනු ලැබිද;

(2) ඒ සඳහා ප්‍රයෝජනය සැලසීමට බලාපොරොත්තුවන යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඇත්නම් එය හෝ ඒවා පහත සඳහන් කියමියන්ට එකඟවද තිබෙතොත් මිස නැත්නම් කිසිවකුට බලපත්‍රයක් ලැබීමට අයිතිවාසිකමක් නැත. ඒ කියමයන් කවරේදයත්:—

(*a*) ගොඩනැගිල්ල හොඳහැටි සෑදී තිබිය යුතුවාත් හැර එය ඇතුළට හොඳට සුර්‍ය වැදෙන ලෙසත් හොඳට එළිය වැටෙන ලෙසත් සැලසෙනතරම් කාණු හා වැසිකිළි පහසුකම් ඇතුවත් තිබිය යුතුයි;

(*b*) ඒ ගොඩනැගිල්ලේ වහල කල් පවතින ද්‍රව්‍යවලින් සෑදී එහි බිම සිමෙන්ති දමා තිබිය යුතුයි;

(*c*) ඒ ගොඩනැගිල්ලේ වහල්පල පොළවේ සිට අඩි හයකට හොඳටම ඉහළ විය යුතුයි;

(*d*) ඒ ගොඩනැගිල්ලේ සෑම කාමරයකම විවෘතකළ හැකිවූ ජනෙල් තිබිය යුතුයි; තවද, ඒ ජනෙල් විවෘතකළවිට ඒ විවෘතව පවත්නා කොටස මතුපිට බිංමින් පහළට වෙන් එක පංගුවකට අඩුනොවිය යුතුයි;

(*e*) ඒ ගොඩනැගිල්ලේ සෑම කාමරයකම බිත්තිවලින් අඩි හයකට නොඅඩුව ගබොල්, ගල් හෝ කොබෝක් ගල් වලින් සෑදන ලදුව තිබිය යුතුයි;

(*f*) ඒ බිත්තිවල ඇතුල් පැති බිම සිට අඩි ගණනේ අඩි හතරකවත් උසට සිමෙන්තියෙන් කපලාරු කොට අවශ්‍ය කොටස් ගුණ බඳමෙන් කපලාරු කරනු ලැබ සුදු ගුණ ගාන ලදුව තිබිය යුතුයි;

(*g*) ඒ ගොඩනැගිල්ලේ ලී වැඩ තෙල් ගාගම කරනලදුව හෝ සුදු ගුණ ගාන ලදුව හෝ තිබිය යුතුයි.

114. බලපත්‍රයක් නිකුත්කරනලද කාලසීමාවක් ඇතුළතවූ ඕනෑම වේලාවක, ඒ බලපත්‍රය නිකුත්කරනුලැබූ අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්ත සඳහා පාවිච්චි කරනු ලබන කිසියම් ගොඩනැගිල්ලක් 113 වැනි අතුරු ව්‍යවස්ථාමය විධිවිධානවලට එකඟව ගොපවත්නේනම් ප්‍රධානතුමා විසින් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ රෙජිස්ට්‍රාර් පිළිබඳ බලපත්‍රකාරයා වෙත භාරකරවන ලබන දැන්වීමකින් ඒ දැන්වීම සඳහන්කර තිබෙන දවසට ප්‍රථමයෙන් ඒ ගොඩනැගිල්ල එකී විධිවිධානවලට එකඟවන පරිද්දෙන් කළයුතු සෑම දෙයක්ම කරන්න ඕනෑය කියා බලපත්‍රකාරයාට නිවේදනය කළහැකිය.

(2) 1 වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරකරනු ලැබූ යම් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් සඳහා බලපත්‍රයක් තිබිමකු විසින් ඒ දැන්වීමේ දැක්වා ඇති කියමයන් එකී සඳහන් කාලය ඇතුළතදී ඉෂ්ටකිරීම පැහැර හැරිය යුතු නැත.

115. 114 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේවූ ඕනෑම දැන්වීමක් බලපත්‍රකාරයා විසින් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්ත යක් කරන්න යන ස්ථානයේ හෝ අලුතින් ඇත්තාදී විටෙක, හෝ බලපත්‍රකාරයා විසින් එකී ස්ථානයේ රක්ෂාවෙහි යොදා ගන්නාලද යම්කිසිවකුව භාරකරන ලද්දවූ විටෙක, එය ඒ බලපත්‍රකාරයාට භාර ගුන්භාක් මෙන් සැලකිය යුතුයි.

116. යම් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කර ගෙන යාම සඳහා බලපත්‍රයක් අය විසින්—

(*a*) ඒ කර්මාන්තය සඳහා පාවිච්චි කරන සෑම ගොඩනැගිල්ල කම් බිම් දිනපතා අතුරා සුඛපවිත්‍ර කිරීමටද;

(*b*) අවු ගණනේ දෙගළක් මිනිසකට එක වරක් බැගින් වත් එබඳු සෑම ගොඩනැගිල්ලකම බිත්තිවල සුදු ගුණ සෑමටද;

(*c*) ඒ කර්මාන්තය සඳහා පාවිච්චිකරන සියලුම උපකරණ මෙවලම් හා භාජන සුඛපවිත්‍රව තැබීමටද;

